
ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P.O.BOX 14373**
**LONDON NW6 3WU**
**E N G L A N D**

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**

*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam




## නිකමුන් බෝකරන උසස් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ඉතා අවුල් සහගත තත්වයකට පත්ව ඇති බව කිවයුතු නොවේ. දරුවෙකු පාසැලකට දමාගන්නට ගනු ලබන දඟිරිය හා දුක් ගැහැට වල සිට ඒ ළමයා උසස් අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලවලට යන තෙක්ද, එයින් පිටව ආ පසුව වුව ද දෙමව්පියන්ට දරුවන් ගැන දරන්නට ඇති බර කිසිසේත් අඩු නොවේ. තරුණ උපාධිධාරීන් පිරිසක් රැකියා ඉල්ලා කොළඹ පැවැත්වූ උද්ඝෝෂණයකට පොලිස් බැටන් පහර හා කඳුලු ගෑස්ප්‍රහාර ලැබීම නිසා බිම වැටී සිටින තරුණයෙකු වැඩිහිටියෙකු විසින් වත්තන් කරගෙන යනු ලබන දුක්ඛදායක පින්තූරයක් ලංකාවේ පුවත්පතක මම දුටුවෙමි.

උපාධියක් ලැබීමෙන් පසුව රැකියාවක් නැතිවීම ඉමහත් අසහනයකි. ඒම උපාධිධාරීන් පමණක් නොව රැකියා නැති සාමාන්‍ය තරුණ පිරිස අප රටේ ඉමහත් ය. ඔවුන්ට ඇති අනාගතය කුමක්ද? ඒනිසාම සමහරු පිටරටකට පැනගන්නට මාන බලති. එසේ නොයන අය රජයට උද්ඝෝෂණය කිරීමෙන් ප්‍රශ්න විසඳාගන්නට බලති. එහෙත් එය සිදුනොවේ. 1971 දී ඇති වූ තරුණ අරගලය හා ඉන් සිදුවූ දුර්විපාක අපි දනිමු. තරුණ ජීවිත විශාල සංඛ්‍යාවක් ඉන් විනාශවිය. එම සිදුවීම් මෙනෙහිකර එවැනි දෙයක් යළි නොවන්නටද, රටේ අනාගතය බාරව සිටින තරුණ අයගේ ශ්‍රමය නිකම්ම අපතේ නොයවා එය රටේ ශුභසිද්ධියට යොදා ගැන්මටද කිසියම් විධිමත් ක්‍රියා පිළිවෙතක් සකස්කරන්නට 71 ට පසු බිහිවූ කිසිදු රජයක් උත්සාහ ගත්තේ නැත. තවමත් නැත. කඳුලු ගෑස් හා බැටන් ප්‍රහාරයකින් ඒ ප්‍රශ්නය විසඳිය හැකිද?

මෙහිදී සැලකියයුතු තවත් පැත්තක් ඇත. ලංකාවේ රැකියා ඉල්ලුම් කරන උපාධිධාරීන් බොහෝ දෙනෙකුට සම්මුඛ පරීක්ෂණයක දී එයට පිළිතුරු දෙන දැනුම නොමැති නිසා අසරණ වන බවත්, ඒ හේතුවෙන් අසමත්වන බවත් එම පරීක්ෂණ මෙහෙයවන අය කියනු මා අසා ඇත. දැන් කාලයේ රැකියාවකට අදාල විෂය දැනුම පමණක් නොව කතාබහ සහ අංග චලන පවා සැලකිල්ලට ගැනේ. ඒවායින් අසමත්වීමත් ඉවත දැමීමට කාරණයකි. ටියුෂන් පන්තියේ ගුරුන් දෙන පාඨමාලා කටපාඩම් කරගැනීමෙන් ද, සරසවි ඇදුරන් දෙන යල් පැනගිය නෝට්ස් වනපොත් කිරීමෙන් ද උපාධිය සමත් වුවත් ඉන් ඔබ්බට පිහිනා යාහැකි ප්‍රායෝගික දැනුමක් අප තරුණ පෙළට නොලැබේ. එහි සම්පූර්ණ වරද අප රටේ උසස් අධ්‍යාපනය භාරව සිටින අයගේ ය. එය හැඩගස්වා ඇති අමනෝඥ ක්‍රමයේය. එය සකස්කළෝ ඉදිරි ලෝකය ගැන නොසිතූහ. ඊටත් වඩා ගොන්කම එම යල්පැනගිය ක්‍රමයටම තවම අප රටේ අධ්‍යාපනය හසුරුවන ආකාරයයි. පොත්ගොඩක් කියවන්නට දීමම අධ්‍යාපනය වේද? කාලයට අනුරූපව තරුණ මනස හැඩගස්වන ඔවුන්ගේ බිය, සැක, ඔතෑනි ගති, පසුබෑම් දුරුකරන අධ්‍යාපන ක්‍රමයක් අප රටට අවශ්‍යය. දැන් ඇති ක්‍රමය තරුණ අසහනය අවුලුවයි. රැකියා නැතිව නිකම්ම කාලය ගෙවන තරුණ සමාජයක් බිහිකරයි.

# සංසාර ගැට ලිහන ඉල් මහ



ඓතිහාසික වාග්විද්‍යාවේ මූල ධර්මයන්ට අනුව සිසිල යන වචනයත්, ලිහිල් යන වචනයත් භාවිතයෙන් පරිණාමයට පත්වෙලා, සරල වී, ලිහිල් වී ඉල් බවට පත්වෙන්න පුළුවන්. ලිහිල් හා සිසිල් යන වචන දෙකේම අර්ථය ඉල් මාසයට ගැලපෙන නිසා ඉල් මාසෙ යන්න අර්ථාන්විත යෙදුමක්.

සිල් යන වචනයෙ තියෙන්නෙත් එහි මුල් ස්වරූපය වූ සිසිල් යන වචනයෙ තේරුමයි. සිල් වලින් කෙරෙන්නෙත් සිත කය වචනය සංවරවෙලා, සෞම්‍යවෙලා සිසිල් වෙන එකයි. ඒ සිසිල්වීම තමා සියළුම දුක්ගිනි නිවන නිවනට පදනමක් වෙන්නෙ. සිතක් සිසිල් වී, නිවිලා, නිවන් දැකීම සිද්ධවෙන්නෙ සිත් රත්කරන ඇලීම් නමැති සංසාර බන්ධන නොහොත් සසර බැමි ලිහිල් වී ගැලවුනාමයි.

ඇලවිලා, තදවෙලා, ගැටගැහිලා තියෙන දේවල් ගැලවෙන්නෙ ඒ ගැට ගැහිලි ලිහිල්වෙලයි. ලලනාවන් නටනකොට ගැට ගැහිලි ගැලවිලා ලිහිල් වෙන වස්ත්‍ර සඳහා ඉහිල් වසන් යන වචන පැරණි සිංහල කාව්‍යවල යෙදිලා තියෙනවා. ඉහිල් යන වචනය හැදෙන්නෙ ලිහිල් යන වචනය සරල වෙලයි. මේ ඉහිල් යන වචනය තවත් ලිහිල් වෙලයි ඉල් බවට පෙරළෙන්නෙ.

එක අතකින් ඉල්මාසෙට ඒ නම ලැබිලා තියෙන්නෙ ඉංග්‍රීසියෙන් 'ඵමපබ ඕටම් කියන සරත් සමය අවසන්වෙන ඉංග්‍රීසි නොවැම්බර් නොහොත් සිංහල ඉල් මාසෙදි උතුරු ඉන්දියාවෙත්, එංගලන්තය වැනි සම ශීතෝෂ්ණ රටවලත් ගස්වල කොළ ඉදිලා, ලිහිල් වෙලා, ලිහිලා සුළඟට වැටෙන නිසයි. ඒ අනුව ඉල් මාසය යනු කොළ ලිහිල් වී ගැලවී හැලෙන මාසයයි.

හිම වැටෙන තරම් සීතල උඳුවප් හා දුරුතු යන මාසවලට පෙර ලබන ඉල් මාසය යනු කාල ගුණය සිසිල් වන මාසයක්. බුද්ධ ශාසනයෙ ප්‍රථම ඉල් පුර පසළොස්වක් පෝදා බුදුහාමුදුරුවො රහතන්වහන්සේලා හැටනමක් නා නා දිශාභාගයන්හි චාරිකාවෙ යෙදෙව්වෙ ඒ ආර්යයන් වහන්සේලා මුළුමනින් සිත්සතන් නිවාගෙන භුක්ති විඳින නිවන් සිසිල එය ලබාගැනීමේ වාසනාව ඇති ලෝක සත්වයින්ටත් බෙදා දී අධ්‍යාත්මික සිසිලක් ලොව පතුරුවන්නයි.

රහත් සිත්වල මතුවෙන නිවන් සිසිලස දැනෙන්නෙ නිවන් දකින වාසනාව නොහොත් හේතු සම්පත් අවදිවෙලා තියන විඥ්ඥාණවන්තයින් නොහොත් සහෘදයන්යයි කිවහැකි සංවේදී පුද්ගල යන්ටයි. විනෙය ජනයන් කියන්නෙ එවැන්නන්ටයි. නිවන් එවැන්නන් විසින් අත්දැකිය හැකි බවයි වේදිතබ්බො විඤ්ඤූහි යන්නෙන් කියවෙන්නෙ.

පසු කාලයේදී ධර්ම සේනාපති මහ සැරියුත් හිමියන් බවට පත්වූ උපතිස්ස පරිබ්‍රාජිකයන්ට අස්සජී මහරහතන් වහන්සේ දුටු මොහොතෙම ඒ උත්තම යන් සපුරා සිත නිවාගත් ආයසී වහන්සේ නමක් බව දැනුණෙ බණ අහල නෙවෙයි. ඒ පරිබ්‍රාජිකයා තුළ අවදි වී තිබුණු විඥ්ඥාණවන්ත භාවය නමැති සංවේදිතාව නිසයි. බුදුහිමියන් දම්සක් සුතුර දෙසා ඉසිපතනයෙහි වැඩවසද්දී බරණැස සිටි යසකුල පුත්‍ර නමැති සිටුකුමරාට ගිහි සැප ගැන කළකිරී මහණදම් පුරා නිරාමිස නිවී සැනසිල් ලක් සොයන සිත් පහළ වූයේ සියළුම සංසාර බන්ධන නමැති ගැට ලිහාගෙන සපුරා සිත්සතන් නිවාගත් බුදුහිමියන් ගේ බුද්ධ ශක්තිය විඥ්ඥාණ ගතවී මෙන් විය යුතුයි.

බුදුහිමියන් බුද්ධ ශාසනයේ ප්‍රථම ඉල්මස පුන් පෝදා රහතන් වහන්සේලා හැටනමක් නානා දිශාභාගයන්ට පිටත් කර හැරියේ විඥ්ඥාණවන්තයින් නමැති විනෙය ජනයන්ට සිත්සතන් සිසිල්කර නිවාගෙන නිවන් සුවය භුක්ති විඳිය හැකි අරිය මඟ හෙළිකරන් නයි. ගිනිගෙන දැවෙන පෘතග්ජන හදවත් නිවන් සුවයෙන් සිසිල් කරනු සඳහායි.

ඉල් මාසය නිවන් සිසිල ලබාගැනීම සඳහා ලොවුතුරු නුවණ අවදිකරන්නෙන් කොළ හැලී ඉපල් බවට පත්වෙන ගහකොළ දෙස බලන විට අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ අවබෝධ කරවීම මගිනුයි. ඒ සිසිල තමතමන් තුළින් මතුවන්නේ ඉල්මාසයේ කොළ හැලී යන පරිදි ඇලීම් නමැති සංසාර ගැට ලිහිල් වී ගැලවී යන විටයි. අප කවදා හරි නිවන් දකින්නෙත් සංසාර බන්ධන නමැති සියළුම ඇලීම් නොහොත් ගැට ලිහී ගිය විටයි.

***සම්මාන මහාචාර්ය නීතිඥ ටී. එස්. අබේවික්‍රම*** **Harrow UK**

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතෝපදේශයෙන්

**එහි ගච්ඡපතො තිෂ්ට වද මෞනංසමාචර**
**එවමාශාග්‍රහග්‍රස්තෛ: ක්‍රීඩන්ති ධනිනෝර්ථිභි:**

***අර්ථය*** : *එව, යව, වැටෙව, නැගී සිටුව, කියව, කතා නොකරව, මෙසේ ආශා නැමැති රාහු ග්‍රහයා විසින් ගිලින ලද්දාවූ වස්තු කැමැත්තවුන් සමග ධනවත්තු සෙල්ලම් කරත්.*

ස්වාමි වරුන්ගේ කෲරත්වය නිසා සේවකයන්ට අත්වන ඉරණම මෙන්ම, දුගී පුද්ගලයින් ධන ආශාව නිසා ධනවතුන් ළඟ හැල්ලුවන ආකාරය මෙම පද්‍යයෙන් විස්තර කර ඇත. කාරණා දෙකක් පැහැදිලි වේ. මින් පළමුවැන්න නම් ආශාව නමැති රාහු ග්‍රහයා විසින් ගිලින ලද්දෙකු සේ යන උපමාවෙන් පැහැදිලි කරන ධන ලෝභියෙකුගේ ලෝභීබවේ දරුණුකමයි. ලෝභය මිනිසුන් අගාධයට හෙළන, මිනිස්කම් විනාශකරන, සමාජ සාරධර්ම ආචාරධර්ම උඩු යටිකුරු කරන උග්‍ර විෂක් වැනි චෛතසිකයෙකි. මෙම චෛතසිකයෙන් මැඩුනහු ඉන් ගොඩගැනීම අපහසු කරුණකි. එනිසාම එය රාහු ග්‍රහයාට උපමා කොට ඇත. රාහු ග්‍රහයා විසින් ගිලගනු ලැබූවෙකුට ඉන් මිදීමක් නැත. ධනයට, වස්තු සම්පත් වලට ගිජුවූවෙකුගේ ස්වභාවය ද එසේ ය.

ධන හා වස්තු තණ්හාවෙන් මෙන්ම, ඒවා පරිභෝජනයේදීත් කිසිසේත් තෘප්තිමත් නොවන මිනිසා ඒවා තව තවත් ලබාගැන්මට නොකරන දෙයක් නැත. නොවිඳිනා වේදනාවක් නැත. ආශාව වැඩිවන තරමටම ඒවා ලබාගැනීමේ ප්‍රවනතාවද වැඩිය. එය වැඩිවන තරමට ම වේදනාවේ ප්‍රමාණයද ඉහළ යනු ඇත.

මෙම පද්‍යයෙන් පෙනෙන අනෙක් කාරණය නම් ධනවතුන්ගේ කෲරත්වයයි. ඇතැම් ධනවතුන් තමන් ළඟ සේවය කරන සේවකයින්ට කාරුණික වන නමුත්, සමහර අය ළඟ එම කාරුණික බව සේවකයන් කෙරෙහි අංශු මාත්‍රයකුදු නැත. මානය, අහංකාරය, වංක බව, අකාරුණික බව, අකෘතඥ බව ආදී බොහෝ පාපී සිතිවිළි ඔවුන්ගේ චරිතය සරසන ආභරණයන්ය. දීනව තමන් ළඟට එන්නහුට අකාරුණිකව කතා බහ කිරීම හා ඔවුන් සතුටු කරනවා වෙනුවට ඔවුන්ට සැර පරුෂවීම, බැණවැදීම එබඳු සේව්‍යයන්ගේ ස්වභාවයයි.

මෙහිදී ධනාශාවේ ගිලී ධනවතෙකු කරා යන දුප්පතෙකුට එවැන්නන් වහරන අයුරු පැහැදිලිකර ඇත ඒ සඳහා යොදා තිබෙන්නේ එව, යව, වැටෙව, නැගී සිටුව, කියව, කතා නොකරව වැනි වදන්ය. සාමාන්‍යයෙන් මෙලෙස තිරිසන් සතෙකුට වුවද කතා නොකරන බව අපි දනිමු. නමුත් ඇහෙන පෙනෙන දේ අනුව ඇතැම් ස්වාමිවරු වැඩිහිටියන්ගෙන් පමණක් නොව ළමුන්ගෙන් පවා මෙහෙය ලබාගන්නේ මෙහෙකරුවන් ලෙස නොව වහලුන් ලෙසිනි. එයට හේතුව මානුෂීය ගුණධර්ම වලින් පිරිහුණු ස්වාමිවරුන් විසින් සේවකයින් සුළුකොට තකනු ලැබීමයි.



මෙහිදී අප කල්පනාවට ගතයුතු වැදගත්ම දෙය නම් තම ශක්ති ප්‍රමාණය තමා විසින්ම අවබෝධකරගෙන කෙනෙකුගෙන් අවමන් නොවන ආකාරයේ ගෞරවාන්විත රැකියාවක නිරතව ධනය ඉපයීමයි. එසේ නොමැතිව අධික ලෝභයෙන් ධනය ඉපයීමට ඉහතින් සඳහන් කළ ධනවතුන් කරා යාමෙන් අන්තිමට ඉතිරිවන්නේ සදාකාලික වේදනාවක්, කලකිරීමක් සහ ඔවුන් කෙරෙහි වෛරයක් පමණි.

**♦ *පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

## ත්‍රිපිටක සාහිත්‍යයෙන්

### අළුත ගෙනා මනමාලි සහ භික්ෂුව

බුදු රජාණන් වහන්සේ මෙසේ වදාළහ.

මහණෙනි,

මනමාලියක් කැන්දාගෙන ආ දිනවලම හරිම ලැජ්ජා සහගතයි. නැන්දම්මාට බයයි. මාමාට බයයි. කිසිවෙකු සමග හරියට මූණ බලා කතා කරන්නේ නැහැ. වචන දෙක තුනකට වඩා කතා කරන්නේ නැහැ. වැඩිපුර එළි පහලියේ සිටින්නේ නැහැ. වැඩ කාරයන්ට පවා අවනතයි.

ඒත් ටික දිනක් ගියාට පසු ඇයට ගෙදරදොර හොඳහැටි පුරුදුයි. නැන්දාගේ මාමාගේ හැටි දැනගෙන අවසානයි. සැමියා හොඳහැටි හඳුනාගෙන අවසානයි. කලින් සිටි මනමාලිය නොවෙයි දැන් ඉන්නේ. 'නුඹලා මේ ගෙදර දන්නේ කුමක්දැයි' අහන තරමට ඇ දැන් ආඩම්බරයි. නැන්දාට මාමාට එකටඑක කතාකරන තරමට ඇ අහංකාරයි.

මහණෙනි, ඇතැම් භික්ෂූන්ද එබඳුය. ගිහිගෙන් නික්ම සසුනට පිවිසුන දිනවල නම් සමහර භික්ෂූන් සෙසු භික්ෂු-භික්ෂුණී, උපාසක උපාසිකා පිරිසට හරිම ලැජ්ජා සහගතයි. අවනතයි. කීකරුයි. ඔවුන් දැන හැඳිනගෙන ආරාමයද හුරුවූ පසු පෙර සිටි භික්ෂූහු නොවෙති. "නුඹලා මේ ආරාමය ගැන දන්නේ කුමක්ද?" අසති. එය සුදුසු නැත. භික්ෂුව සැම දිනකම අළුත ගෙනා මනමාලියක් මෙන් විසිය යුතු ය.

**(*අංගුත්තර නිකායේ වධුකා සූත්‍රය*)**

**♦ පූජ්‍ය පොරවගම ඤාණසිරි හිමි**
**සුසිලාරාමය බඹරවාන Sri Lanka**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 0 2 0 8 3 4 8 7 7 7 2**

**Work Permits and Highly Skilled Migrant Applications done.**
**We also deal with visa refusal from British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place, Colombo 7**
**Tel. 2672432 / 0777686632**